*PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 16-Iss. II, Dec. 2025, 98-109.*
DOI: https://doi.org/10.4038/p.v16i2.74

# සුත්තනිපාතයෙන් හෙළිවන සදාචාරය හා සමාජ සාධාරණත්වය පිළිබඳ අධ්‍යයනයක් [A Study of Morality and Social Justice as Reflected in the Suttanipāta]

**Medawachchiye Sanaghananda**[1]

Abstract

Suttanipāta, which is one of the oldest texts in the Pāli Canon, occupies a unique position in Buddhist literature as a rich repository of early Buddhist teachings presented in prose and verse forms. Indeed, the Suttanipāta provides profound teachings related to the ethical society and social justice. Everyone knows that the current society is not a good one because most religious leaders and governors grow racialist among the people. On the other hand, they have already destroyed the noble qualities in this society in order to achieve their cruel expectations. Therefore, depraved activities have been increased in this society. This problem can be seen not only currently, but also in old India. According to Buddhism, the people who were living in India had been divided into four parts by Brahmanas, and racialist was increased among people. In Vāseṭṭha Sutta, the Buddha explains the nature of human beings according to biology and has been criticized the teachings of the Brahmanas. In Vasala Sutta, the Buddha reveals that anyone never become noble or low in their birth, but they become noble or low because of their deeds. This sutta highlights the equanimity of the Buddha. Apart from that, the Buddha's teachings related to social justice can be seen in Parābhava Sutta and Metta Sutta. Protecting the Five Precepts (Pañcasīla) is crucial to develop the welfare and morality of the society, therefore, the importance of protecting Five Precepts can be seen in Dhammika Sutta, Hemavata Sutta, and Āmagandha Sutta. These suttas declare loving-kindness, how people should live without harming others, and protecting other's rights. In conclusion, following these Buddhist concepts is crucial to eradicate racialist, impurity and build up morality and social justice for all creatures.

**Keywords**: Buddhist Teachings, Five Precepts, Morality, Social Justice, Suttanipāta

---

1. Temporary Lecturer, Department of Applied Buddhist Studies, Bhiksu University of Sri Lanka
E-mail: sanghananda@busl.ac.lk https://orcid.org/0009-0006-2735-9058

Received: 17 June 2025, Accepted revised version: 21 November 2025.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

## හැඳින්වීම

මුල් බුදුසමයට අයත් ඉපැරණිතම බුද්ධ දේශනා ඇතුළත් කෘතියක් වශයෙන් සුත්තනිපාතය හැඳින්විය හැකි ය. සූත්‍ර පිටකයේ ඛුද්දකනිකායට ඇතුළත් ග්‍රන්ථ 15 අතුරින් පස්වන ග්‍රන්ථය සේ සැළකෙන මෙහි ගද්‍යමය හා පද්‍යමය දේශනා මගින් ඉතා ගැඹුරු වූත්, එසේ ම අතිශයින් ම වැදගත් වූත් ධර්ම කරුණු ඇතුළත් සූත්‍රාන්තයන් සම සැත්තෑවක් අඩංගු වී ඇත (සෝරත හිමි, 2017: 107). ථේරවාද ගුරුකුලය විශ්වාස කරන අන්දමට මෙය ප්‍රථම ධර්ම සංගීතියේ දී පිළියෙල කර ඇත (අබේනායක, 2018: 35). සුත්තනිපාතය අරබයා ලියන ලද අටුවාව වන්නේ පරමත්ථජෝතිකාවයි. මෙහි දී සුත්ත නිපාතයට අරුත් සපයා ඇත්තේ මෙලෙසිනි.

"මැනවින් පැහැදිලිව පවසන ලද බැවින් ද, දහමෙහි අරමුණු ඉටුවන බැවින් ද, අරුත මැනවින් පිහිටා ඇති බැවින් ද, ඇසීමට කැමැත්ත ඇති කරන, නූලක් සේ එකම සබඳතාවක් පවත්නා බැවින් ද, සුත්ත යැයි කියනු ලැබේ. ඒ ඒ තැන පැවති, එබඳු සූත්‍ර එක්තැන් කොට, සුදුසු තැනට යොදා එපමණ ම වූ වචන ද ඒ අයුරින් ම සඳහන් කරමින් වෙනස් වූ වෙනස් අදහස් නොමැති නිසා සුත්තනිපාත යැයි කියනු ලැබේ" (සුත්තනිපාත අටුවා, 2008: 1).

සුත්තනිපාත යන මේ ග්‍රන්ථ නාමය ෆෞස්බෝල් මහතා විසින් 'දේශනා සංග්‍රහය' යැයි පරිවර්තනය කොට තිබේ. ඊ. ඇම්. හෙයාර් මහතා විසින් 'සංගෘහිත වෘත්ත' යනුවෙන් ද, කාල් නොයිමාන් මහතා නිපාත යන්න 'ඛණ්ඩ' යනුවෙන් ද, ඕල්ඩන්බර්ග් මහතා 'වරින්වර කරන ලද එකිනෙකට සම්බන්ධයක් නැති දේශනා' යනුවෙන් ද, ඇම්. වින්ටර්නිට්ස් මහතා විසින් සිය 'භාරතීය සාහිත්‍ය වංශය' නම් ග්‍රන්ථයේ දෙවැනි ඛාණ්ඩයේ දී සුත්තනිපාත යන්න 'සූත්‍ර ඛණ්ඩ' යනුවෙන් හඳුන්වා ඇත (ජයවික්‍රම, 2018: 1).

සුත්ත නිපාතය වග්ග 5කින් සමන්විත වේ.

| | |
|---|---|
| උරග වග්ග | - සූත්‍ර 12 |
| චූල්ල වග්ග | - සූත්‍ර 14 |
| මහා වග්ග | - සූත්‍ර 12 |
| අට්ඨක වග්ග | - සූත්‍ර 16 |
| පාරායන වග්ග | - සූත්‍ර 16 |

ඉපැරණි භාෂා ශෛලියකින් සමන්විත සුත්තනිපාතයේ ඉගැන්වීම් විවිධ පැතිකඩ නිරූපණය කෙරෙයි. මෙම පර්යේෂණයේ දී සිදු කරනු ලබන්නේ සුත්තනිපාතයේ ඉගැන්වීම්වලින් ප්‍රකට වන සදාචාරමය ඉගැන්වීම් අධ්‍යයනය කිරීමයි. එය පඤ්ච සීලය, තෘෂ්ණාව, වර්ණ භේදය, කර්මය හා ගිහි-පැවිදි ජීවිතයේ සදාචාරය යන අංශයන් ඔස්සේ විමර්ශනය කෙරෙයි.

## සාහිත්‍ය විමර්ශනය

වැලිවිට සෝරත හිමියන් විසින් ප්‍රවචන සඟරාවට සපයන ලද 'සුත්තනිපාතයේ අට්ඨක වග්ගයේ සූත්‍රවලින් පිළිඹිබු වන කාමයෙහි ආදීනව' නම් පර්යේෂණ ලිපියේ දැකගත හැකි වන්නේ අට්ඨක වග්ගයේ සූත්‍රාන්තයන්ගෙන් ඉදිරිපත් වන බුදුන් වහන්සේ පෙන්වා දී ඇති කාමයෙහි ආදීනව පිළිබඳ ඉගැන්වීම් ය. නමුත් මෙහි සමාජ සදාචාරය හා සාධාරණත්වය සම්බන්ධයෙන් ඇති ඉගැන්වීම් දැකගත නො හැකිය.

මැදගම්පිටියේ විජිතධම්ම හිමියන් සහ උඩුරුපැලැව්වේ හේමාරාම හිමියන් විසින් 2018 වර්ෂයේ සංස්කරණය කරන ලද 'සුත්තනිපාත අධ්‍යයන' නම් ශාස්ත්‍රීය සඟරාවේ සුත්තනිපාතය සම්බන්ධයෙන් ප්‍රාමාණික විද්වතුන් විසින් ඉදිරිපත් කර ඇති ශාස්ත්‍රීය ලිපි 17ක් දැකගත හැකිය. එන්. ඒ. ජයවික්‍රම මහතා විසින් 'සුත්තනිපාතය - එහි නාමය සහ ආකෘතිය', 'සුත්තනිපාතයේ වග්ග පහ හැඳින්වීම', 'සුත්තනිපාතය විභාග කිරීමේදි උපයෝගි කරගත යුතු

ප්‍රමාණ' හා 'සුත්තනිපාතය සහ අශෝක ශිලා ලේඛන', ඔලිවර් අබේනායක මහතා විසින් 'සුත්තනිපාතයේ කාල නිර්ණය', කොස්වත්තේ අරියවිමල හිමියන් විසින් 'සුත්තනිපාතයේ එන මුනි සංකල්පය', සනත් නානායක්කාර මහතා විසින් 'බුදුදහමින් ඇගයෙන ජීවන දැක්ම සහ එමගින් නිර්දිෂ්ට පරමාදර්ශය', පී. ඩී. ප්‍රේමසිරි මහතා විසින් 'මුල් බුදුසමය අනුව සත්‍යය සහ දෘෂ්ටි පිළිබඳ මත ගැටුම් සම්බන්ධයෙන් කෙරෙන විචාරය', මකුරුප්පේ ධම්මානන්ද හිමියන් විසින් 'සුත්තනිපාතයේ මහායාන මූලබීජ', කොටපිටියේ රාහුල හිමියන් විසින් 'සුත්තනිපාතයෙහි ඇතුළත් විනය සංකල්ප තුවටක හා ධම්මික සූත්‍ර ඇසුරෙන් කෙරෙන විමසුමක්', එල්. පී. එන්. පෙරේරා මහතා විසින් 'සේල සුත්ත වීමංසා', ඤාණපෝනික හිමියන් විසින් 'උරග සූත්‍ර ගාථාවන්හි නැවත කියවෙන අග දෙපාදය පිළිබඳ පුනරාවලෝකනය', ගෝණදෙණියේ පඤ්ඤාරතන හිමියන් විසින් 'සුත්තනිපාතයේ ආදි අර්ථකථන සම්ප්‍රදාය: නිද්දේසපාළි', නිමල් ලාල් රංජිත් මහතා විසින් 'පරමත්ථජෝතිකා හෙවත් සුත්තනිපාත අට්ඨකථාව: කෙටි හැඳින්වීමක්', මැදගම්පිටියේ විජිතධම්ම හිමියන් විසින් 'සුත්තනිපාතගත සාධක ඇසුරින් හෙළිවන පාලි භාෂාවේ වැදගත් ශබ්ද ලක්ෂණයක්', මාවතගම පේමානන්ද හිමියන් විසින් 'පාලි සාහිත්‍යය තුළ සංස්කෘත ආඛ්‍යාත වරනැඟීම් රටා සුත්තනිපාතය ආශ්‍රයෙන්', හසන්ත සමරසිංහ මහතා විසින් 'සුත්තනිපාත අධ්‍යයන මූලාශ්‍රය' යන පර්යේෂණ පත්‍රයන් මෙහිදී ඉදිරිපත් කර ඇත. සුත්තනිපාතය සම්බන්ධයෙන් මෙම ශාස්ත්‍රීය සඟරාවේ ප්‍රකාශ වී ඇති කිසිදු පර්යේෂණ පත්‍රයක සමාජ සදාචාරය හා සාධාරණත්වය සම්බන්ධයෙන් අදහස් පළ වී නොමැත.

කොස්වත්තේ අරියවිමල හිමියන් විසින් 2018 වර්ෂයේ දී රචිත 'බුද්ධ ධර්මය' නම් ග්‍රන්ථයේ දි බුදුදහමේ දක්නට ලැබෙන ආචාර විද්‍යාත්මක සංකල්පයන් පිළිබඳ තොරතුරු මෙන් ම බ්‍රාහ්මණික ඉගැන්වීම් සම්බන්ධ තොරතුරු දැකගත හැකි නමුත්, එම සංකල්පයන් සුත්තනිපාතය ආශ්‍රයෙන් ඉදිරිපත් වී නොමැත.

**පර්යේෂණ ගැටලු**

- සුත්තනිපාතයේ සදාචාර ඉගැන්වීම්වල මූලික ලක්ෂණ මොනවාද?
- මෙම ඉගැන්වීම් ඓතිහාසික සන්දර්භයේ ගොඩනැගුණේ කෙසේ ද?
- ඒවායේ සමාජීය-දාර්ශනික බලපෑම් මොනවාද?
- වර්තමාන සමාජය කෙරෙහි ඒවායෙහි ඇති බලපෑම කුමක් ද?

**පර්යේෂණ අරමුණු**

සුත්තනිපාතයේ සූත්‍රාන්තයන්ගෙන් ප්‍රකට වන සදාචාරාත්මක ඉගැන්වීම් පඤ්චසීල ප්‍රතිපදාව හා සමාජ සාධාරණය යන අනුමාතෘකා ඔස්සේ සාකච්ඡාවට බඳුන් කිරීමයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ එළඹුම ඔස්සේ කෙරෙන මෙම අධ්‍යයනයේ දී භාවිත කරනු ලබන ක්‍රමවේදය වන්නේ ග්‍රන්ථ සන්ධාර පර්යේෂණ ක්‍රමවේදයයි. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයවලින් දත්ත රැස් කෙරිණ. එම දත්ත තේමාත්මකව විශ්ලේෂණය කරන ලදි.

**පර්යේෂණයේ වැදගත්කම**

වර්තමාන සමාජය වනාහි ගුණධර්මයන්ගෙන් පිරිහී ජාතිවාදය, ආගම්වාදය පදනම් කරගනිමින්, අන්‍යයන් පහත් කරමින්, යුද්ධය ප්‍රචලිත කරමින් කටයුතු කරන්නේය. මේ තුළින් මිනිසාගේ සදාචාරාත්මක ජීවන රටාව අභියෝගයට ලක්ව ඇති අතර, සමාජ දුරාචාරය වත්මන් සමාජය තුළ බෙහෙවින් ප්‍රචලිත වී ඇත. එබැවින් ම්ලේච්ඡ

සමාජයක් වත්මනේ නිර්මාණය වී ඇත. බුදුන් වහන්සේ විසින් සුත්තනිපාතයේ දී ඉදිරිපත් කර ඇති ඉගැන්වීම් වන පඤ්චසීල ප්‍රතිපදාව, සමානාත්මතාවය, අවිහිංසාව වැනි සංකල්පයන් මෙවැනි පර්යේෂණ පත්‍රයක් මගින් ඉදිරිපත් කිරීම තුළින් සදාචාර සම්පන්න, සමානාත්මතාවයෙන් යුක්ත, මෛත්‍රිය පෙරදැරි කරගත් මානවයකු බිහිකිරීමට පෙළඹවීමක් සිදු කරනු ලබයි.

**සාකච්ඡාව**

**පඤ්චසීලය**

සීලය යනු කායික හා වාචසික සංවරයයි. පුද්ගලයාගේ චර්යාවන් ප්‍රකාශයට පත්වනුයේ කයින් හා වචනයෙනි. අකුශලසහගත පාපී පක්ෂයෙහි නො ඇලී කය වචනය ක්‍රියාත්මක කිරීම සීලයයි. 'වේරමණී' යන වචනය ශික්ෂාපදවල භාවිත වනුයේ එබැවිනි. එහි අර්ථය 'වෙන්වීම' යන්නයි. අකුශලයෙහි නො ඇලී සිටින අතර ම කුසලයෙහි සමාදන් වී හික්මීමත් සීල ශික්ෂාවේ දී ක්‍රියාත්මක වේ (අරියවිමල හිමි, 2017: 372). සීලය වනාහි ත්‍රිශික්ෂාවේ පළමු පියවරයි. මෙයට ගෞරවණීය පුද්ගලයෙකුගේ සියලු ගුණධර්ම ඇතුළත් වේ. එය සාමාන්‍යයෙන් තේරුම් ගන්නේ ගිහියාගේ නිශ්චිත ප්‍රායෝගික ආචාර ධර්ම සංග්‍රහය සැදෙන සදාචාරාත්මක ශික්ෂා පද පහ ගැන සඳහන් කිරීමක් ලෙසයි. මෙම ශික්ෂා පද පහ ආරක්ෂා කිරීමෙන් ආධ්‍යාත්මික ගමන ආරම්භ කරන අතර, සෑම ගිහි බැතිමතෙක් ම මෙම මූලික හැසිරීම් නීති පහ පිළිපැදිය යුතු යැයි අපේක්ෂා කෙරේ (Saddhatissa thero, 2016: 72).

සුත්තනිපාතයේ ඇතැම් සූත්‍රාන්තයන් තුළ පඤ්චසීලය හා සම්බන්ධ ඉගැන්වීම් දැක ගත හැකි ය. බුදුන් වහන්සේ දැකීමට ආරාධනාවන් සිදු කරන හේමවත යක්ෂයාගෙන් සාතාගිරි යක්ෂයා විමසා සිටින්නේ බුදුන් වහන්සේ ප්‍රාණඝාතයෙන් ද, අදින්නාදානයෙන් ද, කම්සැපයෙන් ද, මුසාවාදයෙන් ද වැළකී සිටින කෙනෙක් ද යන වගයි. එයට පිළිතුරු දෙන හේමවත යක්ෂයා පවසා සිටින්නේ බුදුන් වහන්සේ වනාහි ඒ සියල්ලන්ගෙන් ම වැළකී සිටින උත්තමයකු බවයි (සුත්ත නිපාත, 48). පඤ්චසීලය ගිහියාගේ නිත්‍ය සීලයයි. ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර, මුසාවාද, මද්‍යපානය යන ලෝකවද්‍ය පාපයන්ගෙන් වෙන් වීම ඉන් අපේක්ෂිතයි. ආර්යශ්‍රාවක භාවයට පත් ගෘහස්ථයින්ගේ සද්ධා, සීල, චාග, පඤ්ඤා යන ගුණ අතරින් සීල සම්පදාව වන්නේ මේ පඤ්චසීලයයි.

කතමා ච ගහපති, සීලසම්පදා, ඉධ ගහපති අරියසාවකො පාණාතිපාතො පටිවිරතො හොති. අදින්නාදානා... කාමෙසු මිච්ඡාචාරා... මුසාවාදා... සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති. අයං වුච්චති ගහපති සීලසම්පදා (අං. නි. 2, 124).

ලෝකවද්‍ය පාපයන් වන මේ දුසිරිත් පහෙන් යුක්ත වීම පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනයටත්, සමාජගත නිරවුල් පැවැත්මටත් බාධක වෙයි. මේ පඤ්ච දුශ්චරිතය මේ ජීවිතය ද භය වෛරයෙන් යුක්ත කරයි (දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති). පරලොව ජීවිතය ද භය වෛරයට ඇද දමයි (සම්පරායිකම්පි භයං වෙරං පසවති). චෛතසික වශයෙන් ද දුක් දොම්නස් ඇති කරයි (චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති) (සං. නි. 2, 106-108).

බුදුන් වහන්සේ විසින් මෙම පඤ්චසීල ප්‍රතිපදාව පැණවීමේ මුඛ්‍ය අභිලාෂයක් ලෙස බ්‍රාහ්මණිකයන්ගේ යාගයට ප්‍රතිපක්ෂ වීම පෙන්වා දිය හැකි ය. සුත්තනිපාතයේ බ්‍රාහ්මණධම්මික සූත්‍රයේ දී යාගයට එරෙහි පැවති බුදුන් වහන්සේගේ විරෝධය දැක ගත හැකි ය. මේ සූත්‍රයේ එන කරුණුවලින් පැහැදිලි වන්නේ ආදි කාලීන බමුණන් ගුණ ගරුකව පූජ්‍ය තත්ත්වයකින්

ආදර්ශසම්පන්නව, ආචාරශීලීව සිටි බවයි. එකල බමුණෝ ඍජු ය. මෘදු ය. ගුණ ගරුක ය. බුද්ධිමත් ය. අහිංසක ය. ඔවුන්ගේ යාගය දැහැමි ය. එකල ගවයන්ට උසස් තැනක් හිමි විය. මනසින් හා උසින් වූ සිරුරින් ද උසස් විය. කළ යුතු නො කළ යුතු දේ දත්හ. එහෙත් කල් යෑමෙන් ඔවුන් අතර කෙළෙස් වැඩිණි. තෘෂ්ණාව ඇති විය. ඒ නිසා ම යාගයට රජු පොළඹවා ගත්හ. පැරණි දැහැමි යාගය නව මගකට යොමු කළහ. ආධ්‍යාත්මික ගුණ වගාවෙන් ඈත් වූහ. සත්ත්ව ඝාතනයට අනුබල දුන්හ. එබැවින් එතෙක් නො වූ විරූ රෝග බහුල විය. ජනතාව භේද භින්න වූහ. යාගය අවඥාවට පාත්‍ර විය. සමාජය කෙළෙසුන්ගෙන් දූෂණය විය (සුත්තනිපාත, 86-94).

මේ ආකාරයෙන් සකස් වූ බ්‍රාහ්මණ ආගමික සම්ප්‍රදාය කෙරෙහි නො සතුටු වූ ඇතැම් ක්ෂත්‍රියයන් ඉන්දුනදී සභ්‍යත්වයට අයත්ව තිබූ සංකල්ප උපයෝගී කර ගනිමින් බමුණන්ගේ යාගහෝම පදනම් කරගත් කර්ම මාර්ගයට ප්‍රතිචාර වශයෙන් යෝග වෘත්තියට ගරු කරමින් ඥාන මාර්ග යට යොමු විය. ආරණ්‍යක උපනිෂද් යුගවල දක්නට ලැබෙන්නේ මේ විශේෂතාවයි. අනගාරික පැවිදි සම්ප්‍රදායක් බිහි වූයේ ද එහෙයිනි. මේ බ්‍රාහ්මණ හා ශ්‍රමණ සම්ප්‍රදායන්ගේ චින්තනය අභිභවමින් බුදුසමය පහළ වූයේ නිර්මාණවාදයත්, අහේතුකවාදයත්, ආත්මසංක්‍රමණවාදයත් ප්‍රතික්ෂේප කරමිනි.

බුදුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ සිටින සමයේ බුදුන් අභිමුඛයට පැමිණෙන ධම්මික උපාසකයා බුදුන් වහන්සේගෙන් අයැද සිටින්නේ අගාරික වත පිළිබඳව දේශනා කරන ලෙසයි. එම අවස්ථා වේ දී බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ සත්පුරුෂ ගිහි පුද්ගලයා ප්‍රාණඝාතයෙන්, අදත්තාදානයෙන්, කාමමිථ්‍යාචාරයෙන්, මුසාවාදයෙන් හා රහමෙරින් වැළකී සිටින බවයි (සුත්ත නිපාත, 120). අගාරික වත පිළිබඳ මෙම බෞද්ධ ඉගැන්වීම සැබවින් ම බමුණන්ගේ යාගය ප්‍රතික්ෂේප කරන්නකි. බමුණන් යාගය තුළින් සිදු කරනු ලැබුවේ පාලකයින් හා පාලිතයින් මුලාවට පත්කරමින්, අසරණ සත්ත්වයින් ඝාතනයට ලක් කරමින් ස්වකීය සුඛ විහරණය උදා කරගැනීමයි. බුදුන් වහන්සේ විසින් සිදු කරනු ලැබුවේ මරණයට කැප වී සිටි සියලු සත්ත්වයින්ට පඤ්චසීල ප්‍රතිපදාව තුළින් ජීවත් වීමේ අයිතිය ලබාදීමයි. සියලු දෙනා විසින් මෙම පඤ්චසීල ප්‍රතිපදාව ආරක්ෂා කරන්නේ නම් මානව හිමිකම් පිළිබඳ කතිකාවතක් වත්මනේ අවශ්‍ය වන්නේ නැත.

සියලු සත්ත්වයෝ මරණයට බිය වෙති (සබ්බෙ භායන්ති මච්චුනො). එහෙයින් තමාව උපමාවට ගෙන (අත්තානං උපමං කත්වා), අන්‍යයන්ට පීඩා නො කර ජීවත් වන ලෙස (න හනෙය්‍ය න ඝාතයෙ) බුදුසමය උගන්වයි. මෙම ශික්ෂා පද පහ සදාචාරාත්මක ජීවිතයේ අඩිතාලම දමනු ලබයි. යමෙක් සතුන් මරයි ද, නොදුන් දෙය ගනියි ද, අනුන්ගේ භාර්යාවන් කරා යයි ද, බොරු කියයි ද, මත්පැන් බීමෙහි යෙදෙයි ද, එම පුද්ගලයා මෙලොව දී ම තමාගේ සම්පත් නැමැති මූලය සාරාගන්නා බව බුද්ධ දේශනාවයි. යම් පුද්ගලයෙක් ස්ත්‍රීන් කෙරෙහි ලොල් වූයේ ද (ඉත්ථිධුත්තො), සුරාවෙහි ලොල් වූයේ ද (සුරාධුත්තො), සූදුවෙහි ලොල් වූයේ ද (අක්ඛධුත්තො), තමා උපයන ධනය විනාශ කෙරෙයි ද (ලද්ධං ලද්ධං විනාසෙති), එය පිරිහීමේ දොරටුවක් බව (තං පරාභවතො මුඛං) (සුත්ත නිපාත, 34) පරාභව සූත්‍රයේ දැක්වේ. රීස් ඩේවිඩ්ස් මහතා මෙම ශික්ෂා පද පහ පිළිපැදීමේ වාසි 5ක් පෙන්වා දෙයි.

1. යහපත් ක්‍රියා කරන්නා අවංකභාවයෙන් ශක්තිමත් කර්මාන්ත තුළින් විශාල ධනයක් ලබා ගනියි.
2. ඔහුගේ යහපත් කීර්තිය විදේශයන්හි පැතිරෙයි.

3. ඔහු වංශවත්, බ්‍රාහ්මණ, ගෘහ මූලිකයෙක් හෝ ආගමික සමාජිකයෙක් වුව ද, ආත්ම විශ්වාසයෙන් යුතු ව එම සමාජයට ඇතුලු වෙයි.

4. කනස්සල්ලෙන් තොරව මිය යයි.

5. මරණයෙන් පසු ස්වර්ගයේ ඉපදෙයි.

එසේම, මෙම ශික්ෂා පද පහ උල්ලංඝනය කිරීමෙන් සිදුවන අවාසි 5ක් පිළිබඳව ද එතුමා සඳහන් කර ඇත.

1. වැරදි කරන්නා අවංකභාවයෙන් තොර වීම නිසාවෙනුත්, අලසකම නිසාවෙනුත් විශාල විපතකට වැටේ.

2. ඔහුගේ නපුරු කීර්තිය විදේශයන්හි ප්‍රචාරය වේ.

3. ඔහු වංශවත්, බ්‍රාහ්මණ, ගෘහ මූලික හෝ ආගමික පිළිවෙලක සාමාජිකයින් කුමන සමාජයකට ඇතුළත් වුව ද, ලජ්ජාවෙන් හා ව්‍යාකුලත්වයෙන් ඇතුළු වෙයි.

4. කනස්සල්ලෙන් යුක්තව මිය යයි.

5. මරණයෙන් පසු දුක්ඛිත ස්ථානයක උපත ලබයි (Sharma, 2011: 97).

ප්‍රථම ශික්ෂාවෙන් සියලු දෙනාගේ ජීවත්වීමේ අයිතියට ගරු කරයි. දෙවන ශික්ෂාවෙන් ස්වසන්තකයන් පවත්වාගෙන යාමට ඇති අයිතියට ගරු කරයි. තෙවන ශික්ෂාවෙන් මෛථුන සදාචාරයට ගරු කරයි. ඇතැම්හු මේ තෙවන ශික්ෂාපදයේ කාමෙසු යැයි බහුවචනයෙන් ඇති බැවින් පංචකාමගුණය අදහස් කළත් මේ ශික්ෂාව පැහැදිලි කරන හැම තැනක ම බුදුන් වහන්සේ අදහස් කර ඇත්තේ වැරදි ස්ත්‍රී පුරුෂ සේවනයයි (පරස්ස දාරං නාතික්කමෙය්‍ය) (සුත්තනිපාත, 118). සිව්වන ශික්ෂාවෙන් මානව සබඳතාවයන්ට මාධ්‍යය වූ වචනයෙහි විශ්වාසවන්ත භාවයට ගරු කරයි. අවස්ථාවට ගැලපෙන පරිදි (කාලෙන), සත්‍ය වූවක් පිළිබඳව (භූතෙන), මොළොක් වදනින් (සන්හෙන), අර්ථවත් දෙයක් (අත්‍ථසංහිතෙන), මෙත් සිතින් (මෙත්‍තෙන) (ම. නි. 1, 318) කථා කළ යුතු ය. පස්වෙනුව මදයට ප්‍රමාදයට කරුණු වන රහමෙරින් වැළකීමෙන් තමාටත් අනුන්ටත් පහසුව ගෙන දෙයි. මත්වීම හේතුවෙන් අඥාන පුද්ගලයෝ පව්කම් කරති. අන්‍යයන් ද ප්‍රමාදයට පත් කරති. බාලයින්ගේ සිත් ගත්, උමතුව හා මුලාව ඇති කරන මේ අපුණ්‍යායතනය ආර්යශ්‍රාවකයා බැහැර කරයි.

"මදා හි පාපානි කරොන්ති බාලා
කරොන්ති චඤ්ඤෙපි ජනෙ පමත්තෙ

එතං අපුඤ්ඤායතනං විවජ්ජයෙ -
උම්මාදනං මොහනං බාලකන්තං"
(සුත්තනිපාත, 118).

**සමාජ සාධාරණත්වය**

ජාතිවාදය යනු කිසියම් වාර්ගික අනන්‍යතාවයක් මත පදනම්ව අනෙක් ජාතීන් පහත් කොට සළකමින් ස්වකීය ජාතියේ ආධිපත්‍යය තහවුරු කිරීමට දරන උත්සාහයකි. එය ජාතිකවාදයෙන් වෙනස් වන්නේ, ජාතිකවාදය යනු රටක් හෝ දේශයක් කෙරෙහි පවතින සාධනීය බැඳීම සහ ගෞරවය මත පදනම් වූ සංකල්පයක් වන බැවිනි. ජාතිවාදය යන්නට විධිමත් අර්ථ කථනයක් ලබා දී නොමැති වුව ද ඓතිහාසික හා ප්‍රායෝගික සිද්ධීන් ඇසුරින් එය වටහාගත හැකි ය. ඒ අනුව එක් ජාතියක් හෝ මිනිස් වර්ගයක් සෙසු ජාතීන්ට වඩා ජන්මයෙන් උසස් යැයි ද, බුද්ධිමත් යැයි ද, උසස් ලේ ඇත්තේ යැයි ද උසස් වර්ණය ඇත්තේ යැයි ද, ශිෂ්ඨ සම්පන්න යැයි ද තරයේ විශ්වාස කිරීම ජාතිවාදයයි. ඉන් නොනැවතී උසස් යැයි පිළිගත් ජාතියේ පැවැත්ම, අභිවෘද්ධිය හා ව්‍යාප්තිය උදෙසා පහත් යැයි පිළිගත් ජාතීන් හෝ වර්ගයන් සංහාරය කිරීම, වහල් භාවයට ගැනීම, ගම්බිම්වලින් පළවා

හැරීම, ඔවුනට මානව හිමිකම් අහිමි කිරීම හා පහරදීම සාධාරණයැයි පිළිගැනීම ජාතිවාදයයි.

ජාතිවාදය සමාජ සාධාරණත්වය ඉක්මවා යන්නකි. සාධාරණත්වය වූ විශ්වීය න්‍යායට විරුද්ධ වූවකි. ජාතිවාදයා එක්තරා ආකාරයක මානසික රෝගියෙකු බව පිළිගෙන තිබේ. මේ නිසා ම ජාතිවාදය විශ්වාස කළ, එය ව්‍යාප්ත කිරීමට කටයුතු කළ පුද්ගලයින්ගෙන් ඉතිහාසය පුරාවට ම මානව වර්ගයාට සිදු වූයේ අතිමහත් විනාශයකි. මිනිසා ජාති, කුල, ගෝත්‍ර ආදී වශයෙන් විවිධ කණ්ඩායම්වලට බෙදී සිටීම අද ඊයේ සිදුවූවක් නො වේ. ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් ම මෙම තත්ත්වය තිබුණු බවට සාධක හමු වේ. ක්‍රි. පූ. 5000ටත් වඩා ඈතට දිව යන වෛදික සාහිත්‍යයේ පවා වර්ණයට අනුව මිනිසුන් බෙදී සිටි බවට කරුණු හමු වේ. ඍග්වේදයේ පුරුෂ සූක්තයෙහි සඳහන් වන අන්දමට මහා බ්‍රහ්මයා විසින් මිනිසා නිර්මාණය කරන ලද්දේ චතුර් වර්ණයට අනුව ය.

බුදුසමය පහළවන අවස්ථාව වන විට ඒකදේවවාදය යටතේ පරිපූර්ණ ඊශ්වර සංකල්පයක් ගොඩනැගී තිබුණු බව බෞද්ධ පිටක සාහිත්‍යයෙහි දක්නට ලැබේ (දී. නි. 1, 30-32). ඒ දෙවියන් හඳුන්වනු ලැබ ඇත්තේ මහාබ්‍රහ්ම නමිනි. 'බ්‍රහ්මා' නමින් පුරුෂලිංග ශබ්දයකින් හඳුන්වනු ලැබූ ලෝක නිර්මාතෘ වූ පුද්ගල ස්වරූපී දෙවියකු පිළිබඳ විශ්වාසය මුලින් ම ඉදිරිපත් වනුයේ ඍග්වේදයේ 'විශ්වකර්මන්' දෙවියාට කරන ආයාචනයක් ඇතුළත් සූක්තයක ය. නිර්මාතෘ දෙවියන් යනු ජගත් පුරුෂයා ය. මනුෂ්‍යයා ඇතුළු සියල්ල පමණක් නොව වර්ණභේද සහිත සමාජයේ නිර්මාණය ද ඔහුසතු විය. යම් වර්ණභේදයක් වන්නේ නම් ඒවා ද නිර්මාතෘගේ ම කාර්යයන් ය. චතුර්වර්ණය තුළින් නියෝජනය වන්නේ ඒ නිර්මාතෘවරයා ය. ඔහුගේ මුව, දෙබාහුව, දෙකලවා හා දෙපතුල් සමාජයේ කවර වර්ණයක් නියෝජනය කරන්නේ ද යන්න ඍග්වේදයේ සඳහන් වන්නේ මෙසේ ය.

"බ්‍රාහ්මණොස්‍ය මුඛමාසීත්
බාහු රාජන්‍යඃ කෘතඃ

ඌරු තදස්‍ය යද් වෛශ්‍යඃ
පද්භ්‍යාම් ශූද්‍රො අජායත" (අරියවිමල හිමි, 2018: 212).

බුදුන් වහන්සේ පහළ වන අවධිය වන විට භාරතයේ වර්ණභේදය හෙවත් කුලභේදය බමුණන් විසින් ආගමික සංකල්පයක් බවට පත්කරගෙන තිබුණි. ඉන් නො නැවතුණු බමුණෝ සියලු ආගමික, දේශපාලනික, ආර්ථික හා අධ්‍යාපනික කටයුතු මේ වර්ණ අනුව සහජයෙන් ම ඒ ඒ අයට වෙන් කොට ඇති බව ද ප්‍රකාශ කළහ. මිනිසුන් මෙසේ උපතින් ම උස් පහත් වශයෙන් බෙදා ඔවුන්ගේ දේශපාලන, ආර්ථික හා සමාජමය අයිතීන් සීමාකර තිබීම අසාධාරණ දෙයක් බව බ්‍රාහ්මණ ධර්මානුකූලව තම චින්තනය මෙහෙයවන්නෝ නො පිළිගත්හ. ඔවුන්ගේ පිළිගැනීම වූයේ මෙම වර්ණ සංකල්පය ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ සනාතන මිනුමක් බවයි. බ්‍රාහ්මණ වර්ණය ශ්‍රේෂ්ඨ ය. අනිත් වර්ණ පහත් ය. බ්‍රාහ්මණයෝ ශුද්ධිය ලබති. අන්‍යයෝ නො ලබතියි බුද්ධකාලීන බමුණෝ පැවසූහ.

බුදුන් වහන්සේ මෙම වර්ණභේදය මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම්වලට පටහැනි වූ ඓතිහාසික වශයෙන් කිසිදු පදනමක් නොමැති විද්‍යාත්මක හා තාර්කික නො වන යල්පැනගිය නිරර්ථක සම්මුතියක් මිස ආගමික හා සනාතන වැදගත්කමකින් යුක්ත නො වූවක් බව පෙන්වා දුන්හ. එසේ පෙන්වාදීමෙන් නො නැවතුණු බුදුන් වහන්සේ ප්‍රායෝගික ක්‍රියාමාර්ග තුළින් එයට විරුද්ධව ක්‍රියාකරමින් මානව සමානාත්මතාවය ස්ථාපිත කරලීම සඳහා ආදර්ශයන් ද සැපයූහ.

වර්ණභේදය යනු ජාතිවාදයේ ම එක් මුහුණුවරකි. බමුණන් තම වර්ණය ම උසස් යැයි පැවසූයේ උත්පත්තිය පදනම් කරගෙන ය. මහා බ්‍රහ්මයාගේ මුවින් උපන් හෙයින් තම ජාතිය ම ශ්‍රේෂ්ඨ යැයි ප්‍රකාශ කරමින් ජාතිවාදය ම ව්‍යාප්ත කළහ. එහෙත් බුදුන් වහන්සේ බමුණන්ගේ මෙම ජාතිවාදය දැඩිව විවේචනය කළේය. ජාතිවාදය පිළිබඳ බුදුන් වහන්සේගේ ඉගැන්වීම් පැහැදිලි කරන වැදගත් දේශනාවන් කිහිපයක් ම සුත්තනිපාතය තුළ අන්තර්ගත වී ඇත.

ජාතිවාදයට ජීව විද්‍යාත්මක පදනමක් නොමැති බව බුදුන් වහන්සේ පෙන්වා දෙනුයේ වාසෙට්ඨ සූත්‍රය තුළිනි. ගස් වැල් වෙන් කර හඳුනාගන්නේ ඒ ඒ ශාක වර්ගයට උරුම ජාති ලක්ෂණයන් ඇති නිසා බව වාසෙට්ඨ සූත්‍රයේ දී පෙන්වා දෙන බුදුන් වහන්සේ සතුන් පිළිබඳව ද තත්ත්වය එය ම බව පැවසූහ. තණ පඳුරු, මහා වෘක්ෂ, කෘමීන්, පක්ෂීන්, සිව්පාවන් අතර එක් එක් වර්ගයා වෙන් වෙන්ව හඳුනාගැනීම සඳහා ජීව විද්‍යාත්මක සාධක ඇතත් මිනිසුන් අතර එවැන්නක් නොමැති බව බුද්ධ දේශනාවයි.

"යථා එතාසු ජාතීසු

ලිංගං ජාතිමයං පුථු

එවං නත්ථි මනුස්සේසු

ලිංගං ජාතිමයං පුථු" (සුත්තනිපාත, 190).

හිසේ සිට පාදාන්තය දක්වා කායික ලක්ෂණ හා කටහඬ මෙන් ම මෛථුනය වැනි ලක්ෂණ කෙරෙහි පවා අවධානය යොමු කළ බුදුන් වහන්සේ ඒ හැම කරුණකින් ම ගම්‍යමාන වන්නේ සමස්ථ මානව වර්ගයා එකම සත්ත්ව කොට්ඨාසයක් බව පෙන්වා දෙමින් මිනිසුන්ට ජාතිවාදයක් ඇතිකරගැනීමට පදනමක් නොමැති බව අවධාරණය කළහ.

වර්ණභේදය, ජාතිභේදය සමාජ සාධාරණත්වය ඉක්මවා ගිය, මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම්වලට පටහැනි වූ, ප්‍රජාතන්ත්‍රවාදී නොවන ඒක පාක්ෂික බෙදුමක් බවත්, එය පිළිගැනීමට මිනිසුන් බැඳී නැති බවත් බුදුසමය පෙන්වා දෙයි. ජාතීන් වශයෙන් මානවයා වෙන්කර තැබීමේ බමුණන්ගේ ක්‍රියාව මිනිසෙකුට බලහත්කාරයෙන් මස් කවා මුදල් අයකර ගැනීමක් වැනි ක්‍රියාවක් බව බුදුසමය තවදුරටත් පෙන්වා දෙනු ලබයි. යමෙකු නො පිළිගන්නා දෙයක් බලහත්කාරයෙන් ඔහු පිට පැටවීම ප්‍රජාතන්ත්‍රවාදී නොවන ඒක පාක්ෂික, අත්තනෝමතික ක්‍රියාවක් බව මෙයින් පිළිඹිබු වේ. යමෙකු ජාතිවාදයෙන්, ගෝත්‍රවාදයෙන් යුක්තව අන්‍යයන් පහත් කොට සළකා තම ජාතිය ම, තම වර්ගයා ම උසස් යැයි සිතමින් ක්‍රියාකරන්නේ නම් ඔහු පිරිහීමට පත්වන බව පරාභව සූත්‍රයේ සඳහන් වේ.

"ජාතිත්ථද්ධො ධනත්ථද්ධො

ගොත්තත්ථද්ධො ච යො නරො

සඤ්ඤාතිං අතිමඤ්ඤෙති

තං පරාභවතො මුඛං" (සුත්තනිපාත, 34)

තම ජාතිය ම, තම වර්ගයා ම උසස් ය. අන්‍ය ජාතීන් පහත් යැයි ප්‍රකාශ කිරීමේ කිසිදු සත්‍යතාවයක් නොමැති බව යථෝක්ත සූත්‍රයෙන් ගම්‍යමාන වේ. තම ජාතිය ම පාරිශුද්ධ ය. අන්‍ය ජාතීන් අපිරිසිදු යැයි විශ්වාස කරමින් ක්‍රියාකළ අය පිරිහීගිය අවස්ථා ඉතිහාසය පුරාම දැක ගත හැකි ය. මිනිසා කෙතරම් තාක්ෂණයෙන් හා විද්‍යාවෙන් දියුණුවට පත්වුව ද, ජාතිවාදයේ හා වර්ගවාදයේ භයානක විපාකයන් වත්මන් සමාජය තුළ තවදුරටත් ප්‍රදර්ශනය වන ආකාරය හඳුනාගත හැකිය. මෙය ලංකාවට පමණක් සීමා වූවක් ද නො වේ. බටහිර රටවල් අතර ද ජාතිවාදී, වර්ගවාදී මත බහුල වශයෙන් පවතී.

ජාතිවාදය නිසා මිනිසුන් දහස් ගණනින් නොව ලක්ෂ ගණනින් ස්වකීය ජීවිතවලින් සමුගෙන ඇත. මානව ඉතිහාසය පුරා වාර්තා වී ඇති බහුවිධ මානුෂීය සංහාරයන්

සඳහා ජාතිවාදය ප්‍රමුඛ සාධකයක් වී තිබේ. ඇඩොල්ෆ් හිට්ලර් හා ඔහුගේ නාසි හමුදාව විසින් පමණක් ඝාතනය කළ යුදෙව්වන් සංඛ්‍යාව මිලියන පහ ද ඉක්මවයි. මෙය සිදුවූයේ ජාතිවාදයේ ප්‍රතිඵලයක් ලෙසිනි. ජාතිවාදය, වර්ගවාදය සැමදාම මිනිස් වර්ගයාට සිදුකර ඇත්තේ මහත් විනාශයකි. වර්තමානයේ ද ලොව පුරා බොහෝ ත්‍රස්තවාදී කණ්ඩායම් බිහිවෙමින් එම විනාශය ම සිදුකරන අයුරු දැක ගත හැකි ය. තම බලය තර කරගැනීමේ අදිටනින් රටවල් රටවල් අතර පවා යුද්ධය වර්ධනය වී ඇත. මෙම ක්‍රියාව තුළින් පීඩාවට මෙන් ම ජීවිතයෙන් ද වන්දි ගෙවන්නේ මානව වර්ගයා ය. මේ හේතුවෙන් සැවොම එක් වී ජාතිවාදය පරාජය කළ යුතු අතර මේ සඳහා බෞද්ධ ඉගැන්වීම් පාදක කරගත හැකි ය. මිනිසා කිසිවිටකත් උත්පත්තියෙන් උසස් හෝ පහත් බවට පත් නොවන බවත්, මිනිසා උසස් හෝ පහත් බවට පත්වන්නේ මිනිසාගේ ම ක්‍රියාවෙන් බව වසල සූත්‍රයේ සඳහන් වේ.

"න ජච්චා වසලො හොති

න ජච්චා හොති බ්‍රාහ්මණො

කම්මනා වසලො හොති

කම්මනා හොති බ්‍රාහ්මණො" (සුත්තනිපාත, 42)

කුල ක්‍රමයේ අසමානතාවන්ට හා බ්‍රහ්ම දේවධර්මයේ හිස් මවාපෑම්වලට එරෙහිව කටයුතුකළ කෙනෙකු ලෙස බුදුන් වහන්සේ හඳුන්වා දිය හැකි ය. එසේ ම වේද ඉගැන්වීම් ප්‍රතික්ෂේප කිරීමෙන් සහ බමුණන්ගේ ගෞරවය, වැදගත්කම හා කුසලතා පිළිබඳ අහංකාර ප්‍රකාශයන්ට අභියෝග කිරීමෙන් බුදුන් වහන්සේ ප්‍රචලිත බ්‍රාහ්මණික ආගමික හා සමාජ ව්‍යුහයේ අත්තිවාරම් දුර්වල කළ අයෙකු ලෙස සැලකිය හැකි ය (Khetjoi and Thasa, 2017: 173).

බ්‍රාහ්මණයා වුව ද පඤ්චවිධ දුශ්චරිතයෙහි යෙදේ නම් පුරවැසියෙකු වශයෙන් ගර්භාවට ලක්වෙයි. සුචරිතවත් ශුද්‍රයා දුසිරිතෙහි යෙදෙන බමුණාට වඩා උසස් ය. සදාචාර ජීවිතය බමුණන්ගේ ජන්ම උරුමයක් යැයි කියා ගනිතත්, එය අනුගමනය කිරීමට පහත් යැයි සම්මත කුලවල අයට ද හැකියාවක් ඇති අතර, එයින් බමුණන් ලබන ප්‍රතිඵලය ම ලැබිය හැකි ය. දුශ්චරිතයෙහි හැසිරෙන බ්‍රාහ්මණයා දුගතිගාමී වන අතර, සුචරිතයෙහි හැසිරෙන ශුද්‍රයා සුගතිගාමී වන්නේ ය. එබැවින් තවකෙකු නො රවටන ලෙසත්, පහත් නො කරන ලෙසත්, සත්ත්වයින් දුකට පත් වෙනවාට, දුක් ලැබෙනවාට නො කැමති වන ලෙස මෙත්ත සූත්‍රයේ දී බුදුන් වහන්සේ දේශනා කර ඇත.

"න පරො පරං නිකුබ්බෙථ

නාති මඤ්ඤෙථ කත්ථචි නං කඤ්චි

බ්‍යාරොසනා පටිඝසඤ්ඤා

නාඤ්ඤමඤ්ඤස්සදුක්ඛමිච්ඡෙය්‍ය"

(සුත්තනිපාත, 46)

උක්ත සඳහන් කරන්නට යෙදුණු අන්දමට ජාතිවාදයේ කිසිදු පදනමක් නොමැති බවත්, එය හුදු මිථ්‍යා සංකල්පයක් පමණක් බවත් පෙන්වාදෙන බුදුසමය ජාතිවාදයට වඩා සදාචාරාත්මක න්‍යාය ධර්ම සමාජයේ ක්‍රියාත්මක වන ආකාරය කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් බව පෙන්වා දී ඇත. මිනිසාට ශිෂ්ට සම්පන්න විය හැක්කේ ජාතිවාදය, වර්ගවාදය පසෙකලා ආචාර විද්‍යාත්මක පදනමකින් ක්‍රියාකළහොත් පමණක් බව බුදුසමය අවධාරණය කරනු ලබයි.

ජාතිවාදය, වර්ගවාදය සමාජය තුළින් මුලිනුපුටා දැමීම පිණිස බුදුන් වහන්සේ විසින් අනුගමනය කරන ලද න්‍යායක් වූයේ කුලයට කිසිදු ස්ථානයක් ලබා නො දීමයි. ආධ්‍යාත්මික නිදහස සහ විමුක්තියේ උසස්

ජීවිතය සෙවීමේ උත්සාහයන් ශක්තිමත් කිරීම පිණිස කුලයට දී ඇති වටිනාකම බුදුන් වහන්සේ මුළුමනින් ම බැහැර කරන ලදහ. එහි ප්‍රමුඛ අරමුණ වූයේ සදාචාරාත්මක හා ආධ්‍යාත්මික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමයි. සංඝ සමාජයට බ්‍රාහ්මණ වංශයේ කස්සප, ක්‍ෂත්‍රිය වංශයේ ආනන්ද, කරණවැමි උපාලි වැනි අය ඇතුළු වීම තුළින් ඒ බව පැහැදිලි වේ (Varma, 2016: 377).

## නිගමනය

උක්ත සාකච්ඡා කරන්නට යෙදුණේ සුත්තනිපාතයෙන් පිළිබිඹු වන සදාචාරාත්මක හා සමාජ සාධාරණය සම්බන්ධ ඉගැන්වීම් පිළිබඳව ය. සත්ත්වයින්ගේ ජීවත්වීමේ අයිතිය උල්ලංඝනය කරමින් ස්වකීය සුඛ විහරණය උදෙසා යාගය අවියක් කරගනිමින් කටයුතු කළ බමුණන්ගේ ක්‍රියාකලාපය බුදුන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවේ පඤ්චසීල ප්‍රතිපදාව ඉදිරිපත් කරමිනි. පළමු ශික්ෂාපදයෙන් ම සියලු සත්ත්වයින්ට ජීවත්වීමේ අයිතිය ලබා දීම තුළින් ඒ බව පැහැදිලි වේ. මෙම පඤ්චසීල ප්‍රතිපදාව මගින් පෙන්වා දෙන සදාචාරාත්මක ජීවන රටාව මිනිසාගේ මෙලොව ජීවිතය මෙන් ම පරලොව ද සැපය ඇති කරනු ලබන්නේ ය. එසේ ම මෙම පඤ්චසීල ප්‍රතිපදාව මගින් මිනිසාගේ අයිතිවාසිකම් ද සුරක්ෂිත වන්නේ ය. මිනිසා විසින් මෙම පඤ්චසීල ප්‍රතිපදාව අනුගමනය කරන්නේ නම් මානව හිමිකම් පිළිබඳ ඉගැන්වීමක් සහ එවැනි දේවල් සාකච්ඡා කරන කොමිෂන් සභාවක් ආදිය වත්මනට අවශ්‍ය වන්නේ නැත. ගිහි කාමභෝගි පුද්ගලයකු තම දෛනික ජීවිතය පඤ්චසීලයට අනුව ගෙවා දැමිය යුතු බව බුදුන් වහන්සේ ධම්මික සූත්‍රයේ දී දැඩිව අවධාරණය කර සිටින්නේ බුදුන් වහන්සේ විසින් සදාචාර සම්පන්න සමාජයක් අපේක්ෂා කළ නිසාවෙනි. අවවාදයට වඩා ආදර්ශය උතුම් වේ යන ප්‍රකාශය සනාථ වන අවස්ථාවක් ලෙස හේමවත සූත්‍රය පෙන්වා දිය හැකි ය. බුදුරදුන් පඤ්චසීල ප්‍රතිපදාව අනුගමනය කරන උත්තමයකු බව සාතාගිර හා හේමවත යන යක්ෂයන් දෙදෙනාගේ සංවාදයෙන් ගම්‍යමාන වේ. එසේම ආමගන්ධ සූත්‍රයේ දී බුදුන් වහන්සේ පෙන්වා දෙන්නේ පඤ්චසීලය කඩකරමින් අයහපත් ලෙස සමාජයෙහි හැසිරෙන්නා ආමගන්ධයෙන් යුක්ත වන බවයි. මේ හැම ඉගැන්වීමකින් ම ගම්‍යවන කාරණය නම් සමාජ සදාචාරය වෙනුවෙන් මෙම පඤ්චසීල ප්‍රතිපදාව වැදගත් අංගයක් බවයි. උක්ත සූත්‍රයන් ගැඹුරින් අධ්‍යයනය කරන විට පිළිබිඹු වන අනෙක් කාරණය වන්නේ බමුණු ඉගැන්වීම් නිසාවෙන් පීඩාවට පත් වී සිටි ජනයාට මෙම පඤ්චසීල ප්‍රතිපදාව තුළින් සහනයක් සැළසුණු බවයි. සැබවින් ම මෙම පඤ්චසීල ප්‍රතිපදාව වර්තමානයට යෝග්‍ය වන්නේ වත්මන් මිනිසා දුරාචාරයෙන් යුක්තව කටයුතු කරන නිසාවෙන් සමාජ සදාචාරය සෝදාපාලුවකට ලක් වී ඇති නිසාවෙනි.

නූතන සමාජයේ උත්සන්න වී ඇති තවත් බරපතල ගැටලුවක් වන්නේ ජාතිවාදය හා වර්ගවාදයයි. මෙම ජාතිවාදය හා වර්ගවාදය නිසා මිනිසුන් ලක්ෂ ගණනින් තම ජීවිතයෙන් වන්දි ගෙවා ඇත. එසේම ජීවත්වන්නන්ට ද භීතියෙන් හා කුතුහලයෙන් යුක්තව මානසික තෘප්තියකින් තොරව ස්වකීය ජීවිත ගතකිරීමට සිදු වී ඇත. ජාතිවාදය හා වර්ගවාදය දැඩිව පිළිගත් පිරිසක් ලෙස බ්‍රාහ්මණ සමාජය පෙන්වා දිය හැකි ය. මහා බ්‍රහ්මණ්ගේ මුවින් උපන් නිසාවෙන් බමුණන් ශ්‍රේෂ්ඨ වූ අතර, අන්‍යයන් පහත් කොට සළකන්නට යෙදුණි. එබැවින් බමුණන්ගේ ක්‍රියාකලාපයන් නිසා බොහෝ පිරිසක් පීඩාවට පත් වූ අතර, ශ්‍රමණ සම්ප්‍රදාය ආරම්භ වීමට ද මෙය බලවත් සාධකයක් විය. වාසෙට්ඨ සූත්‍රයේ දී බුදුන් වහන්සේ විසින් බමුණන්ගේ මෙම මතය ඛණ්ඩනය කරනු ලබන්නේ මිනිසාට ජානමය වශයෙන් කිසිදු වෙනසක් නො

පවතින නිසාවෙන් කිසිවෙක් කිසිවෙකුට වඩා උසස් පහත් නොවන බවයි. මේ තුළින් සමානාත්මතාවය මෙන් ම බෞද්ධ සමාජ සාධාරණත්වය ද ගම්‍ය වන්නේ ය. වසල සූත්‍රයේ දී බුදුන් වහන්සේ පෙන්වා දෙනු ලබන්නේ උපතින් කිසිවෙක් වසලයෙක් හෝ බ්‍රාහ්මණයෙක් නො වන බවත්, මිනිසාගේ හැසිරීමෙන් වසලයෙක් හෝ බ්‍රාහ්මණයෙක් වන බවයි. බුදුන් වහන්සේගේ මෙම ප්‍රකාශනය බමුණන්ගේ වර්ණභේදය මෙන් ම වත්මනේ තම ජාතිය පමණක් ශ්‍රේෂ්ඨ බවත්, අන්‍ය ජාතීන් පහත් බවත් සිතා කටයුතු කරන ජාතිවාදීන්ට මෙන් ම ආගම්වාදීන්ට ද ප්‍රබල අභියෝග යක් විය. ජාතියෙන්, කුලයෙන්, ගෝත්‍රයෙන් අන්ධ වීම පිරිහීමට හේතුවක් බව සඳහන් වන පරාභව සූත්‍රයේ ඉගැන්වීම යථාර්ථයක් බවට පත්වන්නේ අධික මානයෙන් සිටි බමුණන් විසින් තමන්ගේ ම විනාශය ඇති කරගත් ආකාරය පෙළ සාහිත්‍යයෙන් ප්‍රකට වීමෙනුත්, වර්තමානයේ ජාතිවාදීන් හා ආගම්වාදීන් ද බුද්ධිමත් ජනයාගේ විවේචනයට ලක්වීම නිසාවෙනුත් ය. සියලු සත්ත්වයින් සම සේ සිතා සියල්ලන්ට ම මෛත්‍රී කරන ලෙස සඳහන් මෙත්ත සූත්‍රයේ ඉගැන්වීම බුදුදහමේ පරම අවිහිංසාවාදය ප්‍රකට කරනු ලබන්නේ ය. එබැවින් යථෝක්ත බෞද්ධ ඉගැන්වීම් සමස්ත ජනයා භේදයකින් තොරව අනුගමනය කරන්නේනම් ප්‍රචණ්ඩත්වයෙන් තොර සදාචාර සම්පන්න සමාජයක් නිර්මාණය කර ගත හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය


අංගුත්තර නිකාය II. (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

දීඝ නිකාය I. (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පරමත්ථජෝතිකා නම් වූ සුත්තනිපාතට්ඨකථා සිංහල පරිවර්තනය. (2008). ජේ. පී. නිමල් ලාල් රංජිත්. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මජ්ඣිම නිකාය I. (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මජ්ඣිම නිකාය II. (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සංයුක්ත නිකාය II. (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සුත්තනිපාත. (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.


### ද්විතීයික මූලාශ්‍රය


අරියවිමල හිමි, කොස්වත්තේ. (2018). බුද්ධ ධර්මය. කොළඹ 10ඃ සමයවර්ධන පොත්හල.

විජිතධම්ම හිමි, මැදගම්පිටියේ සහ හේමාරාම හිමි, ඌරුපැලැව්වේ. (2018). සුත්තනිපාත අධ්‍යයන. නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ.

Narada Thero. (1993). The Dhammapada. Taiwan: The Corporate Body of the Buddha Educational Foundation.

Saddhatissa thero, Hammalawa. (2016). Facets of Buddhism. Kandy: Buddhist Publication Society.

Sharma, S. N. (2011). Buddhist Social and Moral Education. Delhi: Parmal Publication.

Varma, V. P. (2016). Early Buddhism and Its Origins. Delhi: Munshiram Manoharlal Publishers Pvt. Ltd.

**සඟරා**

සෝරත හිමි, වැලිවිට. (2017). 'සුත්ත නිපාතයේ අට්ඨක වග්ගයේ සූත්‍රවලින් පිළිබිඹු වන කාමයෙහි ආදීනව'. බෝලියද්දේ ධම්මකුසල හිමි, කුඹුගොඩආරේ පඤ්ඤාලෝක හිමි (සංස්). ප්‍රවචන 08 වන කලාපය, 2 වන අංකය. 106-122 පිටු, අනුරාධපුරඃ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.

Khetjoi, S. and Thasa, P. W. (2017). 'The Buddhist Principles of Social Justice: An Application in Social Work Practice'. Journal of International Buddhist Studies, 8(1). 167-181.